# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2025

**8 ශ්‍රේණිය** | **නාට්‍ය හා රංගකලාව**

නම/ විභාග අංකය: ......................................... කාලය පැය 2 යි

### I කොටස

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

1. නාට්‍ය පෙළින් ප්‍රකාශ වන මූලික අදහස,
   - i. අනුකරණ වේ
   - ii. නාට්‍ය තේමාව වේ
   - iii. රංග විධාන වේ
   - iv. කතා වින්‍යාසය වේ

2. නාට්‍ය පිටපතක ඇති රංග විධාන වැදගත් වනුයේ,
   - i. ප්‍රේක්ෂකයින්ට
   - ii. අනුශාංගික ශිල්පීන්ට
   - iii. නළු නිළියන්ට
   - iv. අර්ථපතිට

3. නළුවාගේ මුහුණ ප්‍රධාන කොට ඉදිරිපත් කරන අභිනය වන්නේ,
   - i. සාත්වික අභිනය
   - ii. අභාර්‍ය අභිනය
   - iii. වාචික අභිනය
   - iv. ආංගික අභිනය

4. ශරීරයේ හිස්, අත්, පාද, පපුව, උකුළ ආදිය හඳුන්වනු ලබන්නේ,
   - i. ප්‍රත්‍යාංග යනුවෙනි
   - ii. උපාංග යනුවෙනි
   - iii. අංග යනුවෙනි
   - iv. ඉහත සියල්ලම යනුවෙනි

5. නාට්‍යයේ පෙළට ගැලපෙන නළුවන් තෝරා ගැනීම
   - i. රූපණයයි
   - ii. සමාරෝපයයි
   - iii. වේශ භූෂණයයි
   - iv. නළු වරණයයි

- **ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා නිවැරදි නම් (√) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද යොදන්න.**

6. පරිකල්පනය යනු වෙනස් අලුතින් යමක් සිතීමේ හැකියාවයි. (    )
7. මාෂා සහ වලසා පාලිත ලොකුපෝතාගම මහතාගේ නාට්‍යයකි. (    )
8. 'ලොබකර දන මිලට දියුණුව පතාගෙන' සිරිත් මල්දමේ කවියකි. (    )
9. සාත්තුවර සෙබලාණෝ නාට්‍ය ගුණසේන ගලප්පත්ති මහතා නිර්මාණය කොට ඇත. (    )
10. බුද්ධගජ්ජය නළුවාට සාත්වික අභිනය ප්‍රගුණ කිරීමට භාවිතා කළ හැක. (    )

- **අංක 11 - 15 දක්වා ප්‍රශ්නවලට දී ඇති හිස්තැන් සඳහා සුදුසු වචනය පහත කොටුව තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

11. නළුවෙකු ශරීරය සැහැල්ලු කිරීම සඳහා ……………………… යොදා ගනී.
12. වේෂභූෂණය නාට්‍යයක ……………………… අයත් වේ.
13. නාට්‍යය ගීතයක් ගායනා කිරීමේදී කාලය, ශ්‍රැතිය මෙන්ම ……………………… අවශ්‍ය වේ.
14. ශාන්තිකර්ම ගී ගායනා කිරීමේදී ……………………… යොදා ගනී.
15. රංගන ශිල්පීන් ……………………… දුරු කර ගැනීම සඳහා රංග අභ්‍යාස වල නිරත වේ.

| |
|---|
| ආහාර්ය අභිනයට / ශිථිලකරණය / තාල වාද්‍ය භාණ්ඩ / ප්‍රකාශනය ද / සබකෝලය |

- **ප්‍රශ්න අංක 16 - 20 දක්වා A කොටසට අදාලව ගැලපෙන වචනය B කොටසින් තෝරා යා කරන්න.**

| A කොටස | B කොටස |
|---|---|
| 16. ශිථිලකරණ අභ්‍යාස | යාතුකර්ම ගී |
| 17. හඬ අභ්‍යාස | ආංගික |
| 18. අභිනය | රූපණය |
| 19. වළහා මාෂා | හිම කන්ද දියවීම |
| 20. රංගන ශිල්පීන් | මී මැස්සන් |

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 03 කට පිළිතුරු සපයන්න.**

1. මාෂා සහ වලහා නාට්‍ය පෙළ ඇසුරු කර ගනිමින් පහත පශ්න වලට පිළිතුරු සපයන්න.

    i. මාෂා සහ වලහා නාට්‍ය අධ්‍යක්ෂකවරයා කවුද? (ල. 2)

    ii. නාට්‍ය ආරම්භයේදී මාෂා වේදිකාවට පැමිණෙන්නේ කොහේ සිටද? (ල. 2)

    iii. මෙම නාාට්‍යයේ දක්නට ලැබෙන සත්ත්ව චරිත 02ක් නම් කරන්න. (ල. 2)

    iv. මෙමනාට්‍ය තුළින් ජීවිතයට ගත හැකි ආදර්ශ 02ක් ලියන්න. (ල. 2)

    v. ඔබ දන්නා තවත් ළමා නාට්‍ය 02ක් නම් කරන්න. (ල. 2)

2.

    i. අභිනය යනු කුමක්ද? (ල. 2)

    ii. සතර අභිනය නම් කරන්න (ල. 4)

    iii. ඉන් ඔබ කැමති අභිනයක් පිළිබඳ කෙටියෙන් ලියන්න (ල. 4)

3.

i. රංග අභ්‍යාස 02 ක් නම් කරන්න. (ල. 2)

ii. රංග අභ්‍යාස වලින් ලැබෙන ප්‍රයෝජන 03ක් ලියන්න. (ල. 3)

iii. එක් රංග අභ්‍යාසයක් සිදු කරන ආකාරය විස්තර කරන්න (ල. 2)

4.

i. නාට්‍යෝපකරණ යනු කුමක්ද? (ල. 2)

ii. නාට්‍යෝපකරණ නිර්මාණයේදී සැලකිලිමත්විය යුතු කරුණු 03ක් ලියන්න. (ල. 3)

iii. එක් නාට්‍යෝපකරණයක් නිර්මාණය කරන ආකාරය පැහැදිලි කරන්න. (ල. 5)

5.

i. නාට්‍ය සඳහා යොදාගත හැකි ආගමික කතා 02ක් නම් කරන්න. (ල. 2)

ii. ඔබ කැමති ඕනෑම කතාවක් භාවිතා කරමින් රංග විධාන, ගැටුම්, සංවාද සහිතව නාට්‍ය පිටපක් නිර්මාණය කරන්න. (ල. 8)